**පේදුරුතුඩුව නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 16 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 27 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ **1.**.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් පේදුරුතුඩුව නගර සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ දෝෂ**

රු.24,000 ක් වූ බදු කුලී මිශ්‍ර තැන්පත් බදු මෙන් සමුච්චිත අරමුදලට මාරු කර නොතිබූ බැවින්, සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 ගෙවිය යුතු මුදල්**

(අ) රු.465,533 ක් පරිසර සුරකුම් ගාස්තු නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය නොකර තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(ආ) රු.220,458 ක් වූ රැඳවුම් මුදල් අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවීම් නොකර 2013 වර්ෂයේ පටන් තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය සාක්ෂි නොමැති වීම නිසා රු.77,968 ක් වටිනා ගනුදෙනු දෙකක් විගණනයේදී සතුටුදායක අන්දමින් සන්නිරීක්ෂණය කිරීමට නොපිළිගැනීමට නොහැකි විය.

### 1.3.4 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) නගර සභා රීති | |
| (i) පරිච්ඡේදය III - රීති 54 (1) | වරිපනම් හා බදු පිළිබඳ උපලේඛන නොවැම්බර් 15 දිනට පෙර ලේකම් වෙත භාරදී දෙසැම්බර් 15 දිනට පෙර ගෙවීම් කර කටයුතු නිමාකළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III - රීති 171 | මුදල් පොත හා අනෙකුත් ලේඛන ලේකම් විසින් නිසි පරිදි පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) නගර සභා ආඥා පනත වගන්තිය 44 (2) | සභාවට අයත් මාර්ග සහ පටු මාර්ග පිළිබඳ උපලේඛනය රජයේ ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි 571 | වසර දෙකකට වඩා පැරණි රු.597,291 ක් වටිනා තැන්පතු පිළිබඳව මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ මෙහෙයුම් මඟින් පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.31,138,713 ක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ අනුරූපී පුනරාවර්තන වියදම ඉක්මවූ අතිරික්තය රු.39,604,771 ක් විය. වියදම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය රු.8,466,058 කින් පිරිහීමට හේතු විය.

### 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ කාරක ප්‍රාග්ධනය රු.177,637,018 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී කාරක ප්‍රාග්ධනය රු.161,485,155 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු.16,151,855 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.3 ආදායම් කළමනාකරණය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | රු'000 |
| | රු'000 | රු'000 | |
| වරිපනම් හා බදු | 985 | 1,064 | 3,160 |
| බදු කුලී | 10,009 | 15,825 | - |
| බලපත්‍ර ගාස්තු | 470 | 524 | - |
| ප්‍රාග්ධන පරිත්‍යාග | - | - | 170 |
| අනෙකුත් ආදායම් | 55,756 | 57,438 | 35,640 |
| | 67,220 | 72,851 | 38,907 |

### 2.3.2 වරිපනම් සහ බදු

රු.3,160,437 ක් වූ වරිපනම් හා බදු සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන නොතිබුණි.

### 2.3.3 බලපත්‍ර ගාස්තු

රු.1,093,537 ක් වූ අයකළ හැකි කුලී හා බලපත්‍ර ගාස්තු සමාලෝචිත වර්ෂය තුලදී අයකර ගෙන නොතිබුණි.

### 2.3.4 මුද්දර ගාස්තු

රු.30,776,769 ක් වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂය තුළදී ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් අයකරගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා විෂය පථයට අයත්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

අයවැය විධිමත්ව පිළියෙල කර නොතිබුණි. ඒ හේතුකොට ගෙන අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර රු.111,211 සිට රු.409,056 දක්වා වූ විචලනයක් සිදුව තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කටයුතු සතුටුදායක අන්දමින් ඉටුකර නොතිබුණි.

### 4.3 විගණනය සහ කළමනාකරණ කමිටු රැස්වීම්

සභාවේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම අන්දමින් සිදුකිරීම සඳහා විගණනය හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය

**අක්‍රීය වත්කම්**

(අ) වසර පහකට අධික කාලයක් තිස්සේ ට්‍රැක්ටරයක් අක්‍රීයව පැවතිණි.

(ආ) රු.1,545,185 ක් වටිනා වාහන ගාල්කිරීමේ අංගනයක් නිෂ්කාර්යව පැවතිණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අයවැය
(ආ) ආදායම් රැස්කිරීම
(ඇ) අත්තිකාරම්
(ඈ) තැන්පතු
(ඉ) වාහන උපයෝජනය
(ඊ) විවිධ ණයගැතියන්